ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

BOC e-තුරු හරිත ඉතිරිකිරීමේ ගිණුම

නිමැවුමේ ස්වභාවය	ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ	ආරම්භක තැන්පතු හා ගාස්තු	සුදුසුකම	ප්‍රධාන නියම හා කොන්දේසි
හරිත ඉතිරිකිරීමේ ගිණුම	• **පොලී අනුපාතය :** දැනට වාර්ෂික පොලී අනුපාතය 1.5% ක් වේ. (මෙම ගිණුමේ පොලී අනුපාතය සාමාන්‍ය ඉතුරුම් පොලී අනුපාතයට වඩා වෙනස් වේ.) නවතම පොලී අනුපාතය බලාගැනීමට https://www.boc.lk/rates-tariff#rupee-deposit-rates වෙත පිවිසෙන්න. • තිරසාර ව්‍යාපෘති සඳහා කරනු ලබන දායකත්වය අගයකරමින් ගිණුම විවෘත කරන අවස්ථාවේදී **හරිත සහතිකයක්** නිකුත්කරනු ලැබේ. • ලංකා බැංකුවෙන් අරමුදල් සපයන ලද තිරසර ණය යෝජනා ක්‍රම සඳහා සහනදායී පොලී අනුපාත • තැන්පතු තිරසර මූල්‍ය යෝජනාක්‍රමවල ආයෝජනය කෙරේ. • E-ප්‍රකාශන • නොමිලයේ SMS alert පහසුකම	• **ආරම්භක තැන්පතුව -** පුද්ගලික : රු.1,500 ආයතන : රු. 10.000 • **සේවා ගාස්තු –** - පුද්ගලික : ගිණුමේ අවම මාසික සාමාන්‍ය ශේෂය රු 1,500/- ට වඩා අඩුවේ නම්, **මසකට රු.35** බැගින් වූ ගාස්තුවක් අයකෙරේ. - ආයතන : ගිණුමේ අවම මාසික සාමාන්‍ය ශේෂය රු 10,000/-ට වඩා අඩුවේ නම්, **මසකට රු.35** බැගින් වූ ගාස්තුවක් අයකෙරේ. • **ගිණුම වසාදැමීමේ ගාස්තු –** පුද්ගලික : රු.500/- ආයතන : රු.500/- • **ගිණුම පවත්වාගෙන යාමේ හා වෙනත් ගාස්තු** - බැංකු ප්‍රකාශ ලබාගැනීම - ගිණුම් ශේෂයන් තහවුරු කිරීම - ස්ථාවර නියෝග ලියාපදිංචිය සහ මුදල් හුවමාරුකිරීම් - අන්තර්ජාල බැංකුකරණ සේවා ගාස්තු ගාස්තු දැනගැනීමට https://www.boc.lk/rates-tariff#general- tariff වෙත පිවිසෙන්න. • **බදු -** පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යවස්ථාපිත අයබදුවලට යටත් වේ.	- පුද්ගලික : වයස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලංකාවේ නේවාසිකයන්. තනි පුදගල හා බද්ධ ගිණුම් විවෘත කළ හැකිය. - ආයතන : ශ්‍රී ලංකාවේදී නිසි පරිදි ලියාපදිංචි ආයතන (සංගම්, සමාගම් වැනි) **ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර** ➢ පුද්ගලික - ජාතික හැඳුනුම්පතේ (NIC)/ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්; - දැන් සිටින ලිපිනය හා NICහි සඳහන් ලිපිනය වෙනස් වේ නම්, ලිපිනය තහවුරුකිරීමේ ලේඛන; - ගිණුම විවෘත කරන බැංකු ශාඛාවට අයදුම්පතේ දී ඇති ස්ථිර ලිපිනය දුරින් පිහිටා තිබේ නම් ඒ සඳහා වලංගු හේතුවක් ද සමග, ඉතිරිකිරීමේ ගිණුම් විවෘතකිරීමේ විශේෂ අයදුම්පත පුරවා ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න. ➢ ආයතන : ගිණුම් විවෘතකිරීමේ අයදුම්පත සහ අවශ්‍ය සනාථකිරීමේ ලේඛන බැංකුවේ දැනට පවතින මාර්ගෝපදේශයන්ට අනුව, ආයතන වර්ගය මත පදනම්ව ඉදිරිපත් කළ යුතුය. (ලියාපදිංචිකිරීමේ ලේඛන, යෝජනා සම්මුතීන්, අයිතිකරුගේ විස්තර වැනි)	- අවසර ලබාදෙන තිරසර සංවර්ධනය/ හරිත මූල්‍ය ව්‍යාපෘතියේ කාර්‍ය සඳහා තැන්පතු මුදල අනුව අත්තිකාරම් ලබාදේ. - ATM කාඩ්පත් සහ ඉතුරුම් පාස්පොත් නිකුත්කරනු නොලැබේ. - නිමැවුමට අදාළ සියලු නියමයන් හා කොන්දේසි දැනගැනීම සඳහා ගිණුම විවෘතකිරීමේ අයදුම්පත බලන්න.

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- එක් තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.
- අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය;
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා ප්‍රමුඛතාව පදනම් කොටගෙන සලකා බලනු ලැබේ.
- **දුරකතන:** +94 11 220 4750 / +94 11 243 5814 **ෆැක්ස්**: +94 11 243 5815 **විද්‍යුත් ලිපිනය**: bocexmgt@boc.lk **වෙබ් අඩවිය:** https://www.boc.lk **තැපෑල:** ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු, 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.
- අපගේ කුමන හෝ ශාඛාවක්, සේවා ඒකකයක්, හෝ ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න.අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.